**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**ඡේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Cmmonwealth
BSB - 063619
Acc - 10852409

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්4ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත



# ගමේ ආණ්ඩු නිසා රජය ඉදිමී පුපුරන්නට නො දී වැඩ ගන්නේ කෙසේ ද?

අජිත් පැරකුම් ජයසිංහ



පෙබරවාරි මාසයේදී අලුත් පළාත් පාලන ආයතන පත් වනු ඇත. එසේම, එම මැතිවරණයේ ජය පරාජයන් විසින් අනාගත දේශපාලනයේ දිශානති ද පැහැදිලිව සලකුණු කරනු ඇත. මේ මොහොතේ ලංකාවට අවශ්‍යව තිබෙන්නේ දේශපාලන ස්ථාවරත්වයකි. එය ගොඩනගා ගැනීමට නම් ආණ්ඩුව ශක්තිමත් විය යුතුව තිබේ. ආණ්ඩුව තුළ ද ගැටුමක් ඇති බව කවුරුත් දනිති. එහෙත්, ඡන්ද ව්‍යාපාරවල අවලාද, මඩගසාගැනීම් කෙසේ වෙතත්, ආණ්ඩුවේ පාර්ශ්ව 2020 දක්වා එක් ගමනක් යා යුතු ය. රටේ මේ මොහොතේ බලවත් ම දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය දැනටමත් ඒ තීරණයට එළැඹ තිබේ. කෙසේ වෙතත්, මෙම මැතිවරණයෙන් දේශපාලන බලතුලනයෙහි කැපී පෙනෙන වෙනසක් ඇති වන බවක් දැනට නිරීක්ෂණය වී නැත.

**ඇතැම් තැන්වල රාජ්‍ය නිලධාරීන් මහා පරිමාණෙන් මහජන මුදල් ගසාගෙන කෑම කරගෙන ගිය හ. රාජ්‍ය නිලධාරීන් කිසි සේත් ම දේශපාලකයන්ට නො දෙවෙනි පිරිසක් බව ද, දේශපාලකයන් නම් අඩු තරමේ ඡන්දයකදී හෝ මහජනතාවට වගකියන බව ද රාජ්‍ය නිලධාරීන් එහෙමවත් නැති බව ද නිලධාරීන්ගේ පළාත් පාලනයෙන් නැවත, නැවත ඔප්පු විය.**

වසර දෙකකටත් වැඩි කාලයක් තිස්සේ පළාත් පාලන සභා ක්‍රියාත්මක වූයේ නැත. පළාත් පාලන ආයතන පැවතියේ කොමසාරිස්වරුන්ගේ හෝ ලේකම්වරුන්ගේ පාලනය යටතේ ය. ඡන්දයෙන් පත් වූ සභාපතිවරුන්ගේ හා සභාවක පාලනය යටතේ තිබුණු යුගයට වඩා කිසිදු නරකක් නිලධාරි පාලනයක් පැවැති මෙම යුගයෙහිදී ද තිබුණේ නැත. පළාත් පාලන අයතනවල කටයුතු සාමාන්‍ය අන්දමින් සිදු වුණ අතර ඡන්දයෙන් පත් වූ සභිකයන් නො සිටි නිසා ඔවුන්ගේ පාර්ශ්වයෙන් සිදු වන දූෂණ දක්නට නො ලැබිණි. අවාසනාවකට මෙන් ඒ හැටි හොඳක් තිබුණේ ද නැත. ඇතැම් තැන්වල රාජ්‍ය නිලධාරීන් මහා පරිමාණෙන් මහජන මුදල් ගසාගෙන කෑම කරගෙන ගිය හ. රාජ්‍ය නිලධාරීන් කිසි සේත් ම දේශපාලකයන්ට නො දෙවෙනි පිරිසක් බව ද, දේශපාලකයන් නම් අඩු තරමේ ඡන්දයකදී හෝ මහජනතාවට වගකියන බව ද රාජ්‍ය නිලධාරීන් එහෙමවත් නැති බව ද නිලධාරීන්ගේ පළාත් පාලනයෙන් නැවත, නැවත ඔප්පු විය. එහෙත්, පළාත් පාලන සභා නැති වීම නිසා මහජන නියෝජිතකම පාවිච්චි කරමින් චන්ඩිකම් කරන, සොරකම් කරන, අපරාධ කරන පිරිසෙහි අඩුවක් ද තිබිණි. එහි හොඳ පැත්තක් මෙන් ම නරක පැත්තක් ද තිබිණි. බිම් මට්ටමේ දේශපාලන නායකත්වයක් නැතිකම විශේෂයෙන් ම ආණ්ඩුවට ගැටලුවක් වූ බව දක්නට ලැබිණි.

කෙසේ වෙතත්, පෙබරවාරියෙන් පසු නැවතත් පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වන්නට පටන් ගත් විට ඇති විය හැකි නරක තත්වයන් පාලනය කර ගන්නට පුරවැසියන් පැත්තෙන් අවබෝධයෙන් යුතුව මැදිහත් වීම අවශ්‍ය ය. කලින් සිටියේ පළාත් පාලන සභිකයන් 4500කට ආසන්න පිරිසකි. අලුතෙන් පත් වන පළාත් පාලන මන්ත්‍රීන් 8300කට වැඩි පිරිසක් නඩත්තු කරන මහජනතාවට ඔවුන්ගේ ප්‍රයෝජනවත්කම පිළිබඳ වග විය යුතු තැනට දේශපාලකයන් පොළඹවා ගැනීම ලෙහෙසි පහසු දෙයක් වන්නේ නැත. 2017 වසරේ අයවැය ලේඛනයෙන් වෙන් කරන ලද මුදලට අමතරව තේරී පත් වන සභිකයන්ගේ දීමනා හා අනෙකුත් වියදම් වෙනුවෙන් අලුතින් රු. කෝටි 74ක් අවශ්‍ය වනු ඇතැයි පළාත් සභා හභා හා පළාත් පාලන අමාත්‍යාංශය ගණන් බලා තිබේ. ප්‍රාදේශීය සභිකයකුට රු. 15,000 බැගින් ද, නගර හා මහ නගර සභිකයකුට රු. 20,000 බැගින් ද, සභාපතිවරයකුට රු. 25,000 බැගින් ද මහජන මුදලින් දීමනා ගෙවිය යුතු ය. වැඩි වන මන්ත්‍රීන් වෙනුවෙන් අලුතෙන් ශාලා, පුටු මේස, විදුලි පංකා, ලිපි ලේඛන සැපයිය යුතු ය. එසේම, පළාත් සභා මට්ටමෙන් උප නීති සම්මත කර ගනිමින් රැස්වීම් සඳහා දීමනා, ආහාර පාන, ගමන් ගාස්තු ආදිය ද ඔවුන් මහජන මුදලින් වෙන් කර ගන්නවා ඇත. සභිකයන් සංඛ්‍යාව දෙගුණයකට ආසන්න වශයෙන් වැඩි වීම නිසා වියදම් හතර ගුණයකින් පමණ වැඩි වනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය. එසේම, ඉක්මණින් ම ඔවුන් සිය දීමනා ප්‍රමාණවත් නැති බව කියා වැඩි වැටුප් හා වෙනත් ආදායම් ඉපැයිය හැකි මාර්ග අපේක්ෂා කරනු ඇත.

පළාත් පාලන මන්ත්‍රීන් අයථා ක්‍රමවලින් මහජන මුදල් ගසා කන ආකාරය ගැන කදිම විස්තරයක් ගිය සතියේ ඉරිදා ලංකාදීප පුවත්පතට දොම්පේ අජිත් මදුරප්පෙරුම විසින් ලියා තිබණි. ගම් මට්ටමෙන් ඡන්දය ඉල්ලන වැඩි දෙනෙකු මෙවැනි තත්වයන් වෙනස් කිරීමේ හැකියාවක් හෝ උවමනාවක් ඇති අය නො වේ. ඔවුන් ඇට මැස්සන් රැනක් සේ පළාත් පාලන ආයතනය වසා ගත් කල මහජනතාවට අත් වන ඉරණම කුමක් වනු ඇද්ද? මේ

8 වන පිටට